## 13. කර්ම ප්‍රත්‍යයේ ත්‍රි රාශිය

කර්ම ප්‍රත්‍යය සහජාත කර්ම ප්‍රත්‍යය, නානාක්ෂණික කර්ම ප්‍රත්‍යය යි දෙවැදෑරුම් වේ. එකුන්අනූ චිත්තයෙහි ඇත්තා වූ චේතනා එකුන්අනූව සහජාත කර්ම ප්‍රත්‍යය නම් වේ. එකුන්අනූ චිත්තය ය, චේතනාවෙන් අන්‍ය චෛතසික එක්පණස ය, චිත්තජ රූප ය, ප්‍රතිසන්ධි කර්මජ රූප ය යන මොවුහු සහජාත කර්ම ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය. චේතනා එකුන්අනූව ය, බාහිර රූප ය, ආහාරජ රූප ය, ඍතුජ රූප ය, අසංඥ සත්ත්ව කර්මජ රූප ය, ප්‍රවෘත්ති කර්මජ රූප ය යන මොවුහු සහජාත කර්ම ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යනීක ධර්මයෝ ය.

අතීත වූ එක්විසි කුශල චිත්තයෙහි හා දොළොස් අකුශල චිත්තයෙහි වූ චේතනා තෙතිස නානාක්ෂණික කර්ම ප්‍රත්‍යය නම් වේ. විපාක සිත් සතිස ය, චෛතසික අටතිස ය, ප්‍රතිසන්ධි කර්මජ රූප ය, අසංඥ සත්ත්ව කර්මජ රූප ය, ප්‍රවෘත්ති කර්මජ රූප ය යන මොවුහු නානාක්ෂණික කර්ම ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය. කුසල් සිත් එක්විස්ස ය, අකුසල් සිත් දොළොස ය, ක්‍රියා සිත් විස්ස ය, චෛතසික දෙපණස ය, චිත්තජ රූප ය, බාහිර රූප ය, ආහාරජ රූප ය, ඍතුජ රූප ය යන මොවුහු නානාක්ෂණික කර්ම ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යනීක ධර්මයෝ ය.

---

**සහජාත කර්ම ප්‍රත්‍යය** - "කරණං - කිරීම, කම්මං - කර්මය යි". කාය වේගය කාය විඥප්තිය ද වාක් වේගය වචී විඥප්තිය වන්නාක් මෙන් සිතේ වේගය ප්‍රයෝග ව්‍යාපාරය යැයි කියනු ලබයි. එය අභිධ්‍යායාර්ථ වශයෙන් චේතනාව යි. එබැවින් චේතනාව ප්‍රයෝග ව්‍යාපාරය හේතුවෙන් ප්‍රධාන ශිෂ්‍යයා හා සමාන වේ. ඒ චේතනාවේ විශේෂ වන්නා වූ ව්‍යාපාර ශක්තිය කර්ම ප්‍රත්‍යය නම් වේ. කර්ම ප්‍රභේද දෙක අතරින් තමා හා එක්ව උපදින්නා වූ ධර්මයන්ට උපකාර වන්නා වූ චේතනාව සහජාත කර්ම ප්‍රත්‍යය වීම හේතුවෙන් එය ප්‍රත්‍යයෝත්පන්නවල ඇතුළත් නොවී ප්‍රත්‍යනීකවල ඇතුළත් වේ.

**ප්‍රත්‍ය ප්‍රත්‍යයෝත්පන්න** - පළමු ලෝභ මූල සිත සහ චෛතසිකයන් උපදින විට දී චේතනාව ප්‍රත්‍යය වේ. පළමු ලෝභ මූල සිතෙහි චේතනාව හැර සෙසු චෛතසික අටළොස ද ලෝභමූල සිත හේතුවෙන් පහළ වන්නා වූ චිත්තජ රූපයෝ ද ප්‍රත්‍යයෝත්පන්න වෙති. (මෙහි ප්‍රත්‍යය සඳහා ලැබෙන්නා වූ චේතනාව ප්‍රත්‍යනීකයකි. මෙම ක්‍රමයෙන් අර්හත් ඵලය දක්වා දත යුතු වේ.) ප්‍රතිසන්ධි

කෘත්‍යය සිදු කරන මහාවිපාක ප්‍රථම සිතෙහි යෙදෙන චෛතසිකයන්හි ඇතුළත් වන චේතනාව ප්‍රත්‍යය වේ. එම සිතෙහි චේතනාව හැර සෙසු චෛතසික දෙතිස ද ප්‍රතිසන්ධි කර්මජ රූප ද ප්‍රත්‍යයෝත්පන්න වේ. ප්‍රතිසන්ධි සිත් සියල්ල ම මේ ක්‍රමයෙන් දත යුතු වේ. අරූප භූමියෙහි උපදින අවස්ථාවල දී ප්‍රත්‍යයෝත්පන්නයන්හි රූප ඇතුළත් නො වේ. ප්‍රත්‍යනීක සඳහා ඇති ස්වරූපාර්ථ සුගම ය.

**නානාක්ෂණික කර්ම ප්‍රත්‍යය -** නානා - වෙන් වූ, ඛණො - ක්ෂණය, නානාක්ඛණො - නානාක්ඛණ නම් වේ. නානක්ඛණෙ - නානාක්ෂණයෙහි, පවත්තං - උපදින්නා වූ කර්මය, නානාක්ඛණිකං - නානාක්ඛණික නම් වේ. සහජාත කර්මයේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ප්‍රත්‍ය ධර්මයන් උපදින්නා වූ එම ක්ෂණයේ දී එකට ම පහළ වන්නාක් මෙන් මෙම නානාක්ෂණික කර්මයේ දී ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ එකට ම පහළ නො වෙත්. ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන් උපදින ක්ෂණය පසුව ද කර්ම චේතනාව පහළ වන්නා වූ ක්ෂණය පෙර ද වේ. මෙසේ ප්‍රත්‍යයෝත්පන්නයෙන් වෙන් වූ ක්ෂණයන්හි දී පහළ වන චේතනාව නානාක්ඛණික කම්ම නම් වේ. බීජය, ජලය ආදී හේතූන්ගේ උපකාරය ලැබීමෙන් පෘථුල වූ වෘක්ෂයක් උපදවන්නාක් මෙන්, මෙම නානාක්ෂණික චේතනාව ගති, කාල, උපධි, ප්‍රයෝග ආදී හේතු ධර්මයන්ගේ උපකාර ලදහොත් පෘථුල විපාක නාමස්කන්ධයන් ද කර්මජ රූපයන් ද පහළ කරවමින් (ස්කන්ධ සන්තති භව වෘක්ෂය පහළ වීමට) මස්තකයට පමුණුවයි. විස්තර කරන්නෙමි - පහනක් දල්වන විට දී එකවර අඳුර දුරු කිරීම ද ආලෝකය පහළ කරවීම ද යන කෘත්‍යයන් දෙක ම සිදු කරවන්නාක් මෙන් කුසල අකුසල චේතනාවෝ ද තමා සමඟ එක්ව උපදින ධර්මයන්ට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම ද පසුව විපාකයන්ට නානාක්ෂණික කර්ම ශක්තියෙන් උපකාර වීම ද යන මෙම කෘත්‍යයන් දෙක ම එක්වර සිදු කරයි.

**නිරුද්ධ වීමෙන් පසුව වුව ද ඵලයන් ගෙනදීම -** "කුසලාකුසල චේතනාවෝ නිරුද්ධවීමෙන් පසු ක්ෂණ වශයෙන් එකිනෙක වෙන් වන අතර භව බොහෝ ගණනකින් වෙන් ව ඵලයන් පහළ කරවයි" යන කාරණය සාමාන්‍ය නුවණින් සිතා බැලුවහොත් විශ්වාස කිරීමට අපහසු ය. එසේ වුව ද ලෝකයෙහි විද්‍යමාන නොවන අවස්ථාවල දී ම ඵලයන් පහළ කරවන අවස්ථා බොහෝ ගණනක් දක්නට ලැබේ. දූරදර්ශී දෙමව්පියෝ තම දරුවන්ට කුඩා කල පටන් නීරෝගී භාවයට හේතු වන ආහාර සහ බෙහෙත් වර්ග අනුභව කරවති. එම ආහාර සහ බෙහෙත් හේතුවෙන් පහළ වූ රූපයෝ දීර්ඝ කාලයක් පවතින ඒවා නො වෙත්. ඒ දරුවන් වැඩුණු පසු

අන්‍යයන්ට වඩා නිරෝගී වූ රූප සන්තතියක් ලැබේ. ඊට අමතරව කුඩා කල ඉගෙන ගත් ශිල්පයන් සැමදා නො පවතියි. ඇතැම් ශිල්පයන් නිවැරදිව මතකයේ නොතිබුණ ද කුඩා කල උගත් බැවින් ඒ ශිල්පයන් වැඩිහිටි වූ විට උපකාරක වෙමින් ඥානය දියුණු කරවයි. මේ ආකාරයට නොමැති වන්නා වූ නිරුද්ධයට ගොස් පසුව උපකාර වන විට දී වෙනත් පුද්ගලයෙකු එහි ඵල විඳිනුයේ නො වේ. ඒ පුද්ගලයා ම එහි ඵල විඳියි. මෙසේ නිරුද්ධ වීමෙන් අනතුරුව විපාක දීම ලෝකයෙහි ඇති බැවින් මෙම කුසල අකුසල චේතනාවන් නිරුද්ධ වීමෙන් අනතුරුව ඵලයන් ජනිත කරවීම පිළිබඳව සැක නොකළ යුතු.

**ශක්තිය ප්‍රකට වීම -** "කුසලාකුසල චේතනාවෝ නිරුද්ධවීමෙන් පසු" යැයි කියනුයේ නමුදු කිසිදු ධර්මයක් ඉතිරි නොකරමින් අනවශේෂ වශයෙන් නිරුද්ධ වූයේ නො වේ. උත්පාද, ස්ථිති, භඞ්ග සිදු කරවමින් පරමාර්ථ ධර්ම ස්කන්ධයන් විනාශ වූයේ නමුදු කුසල අකුසල චේතනාවේ ශක්තිය ඉතිරිව පවතියි. මෙහි කුසලාකුසල සිත් පහළ වීම සහ විපාක සිත් පහළ වීම ගැන ගැඹුරින් සිතිය යුතු තැනකි. ඒ ඒ කෘත්‍යය සිදුකරන අවස්ථාවේ දී ජවන් සිත් සහ මිශ්‍රව පැවතීම හේතුවෙන් ඒවා පහළ වන්නා වූ ආකාරය ප්‍රකට නොවූයේ නමුදු විපාක සිත් තනිව ම යෙදෙන්නා වූ තදින් නින්ද ගිය අවස්ථාවේ දී එය මනාව ප්‍රකට වේ. විපාක චිත්ත සන්තතිය අතිශය සියුම් වේ. ඒ විපාකයන් සමඟ සම්ප්‍රයුක්ත චේතනාවන්ගේ ව්‍යාපාරය ද දැඩි වූවක් නො වේ. එබැවින් තදින් නින්ද ගොස් ඇති අවස්ථාවක දී ශරීරය විකාරයන් නොදක්වා නිශ්චලව පවතියි. සාමාන්‍ය කුසල අකුසල සිත් උපදින අවස්ථාවක දී ප්‍රකට නොවනුයේ නමුදු ශක්තිමත් චේතානවන්ගෙන් සිදුකරන කුසල අකුසලයෝ හොඳින් ප්‍රකට වෙත්. ඉෂ්ටාරම්මණයක ලෝභ මූල සිත් උපදින විට, අනිෂ්ටාරම්මණයක ද්වේෂ මූල සිත් උපදින විට, බුද්ධාදීන් කෙරෙහි ගරු කරමින් අරමුණු කරන විට, ප්‍රීති ප්‍රමෝද්‍යයෙන් යුතුව දනාදිය සිදුකරන විට මහාකුසල් සිත් පහළ වීම සිතා බලන්න. එම අවස්ථාවල දී සිත් සහ චේතනාවෝ ජව සම්පන්න වෙති. එබැවින් චේතනාව උත්පාද, ස්ථිති, භඞ්ගයනට පැමිණ අභාවයට ගියේ නමුදු ඒ චේතනාවේ ශක්තියෙන් පරිවර්තනය වී ස්කන්ධ සන්තතියෙහි (අනුසය මෙන්) ශේෂ වේ. අනන්තර ශක්තියෙන් එක් සිතක් තව සිතකට උපකාර කරමින් දිගින් දිගට ම පවතින විට දී ඒ චිත්ත සන්තතියෙහි බොහෝ චේතනාවන්ගේ ශක්තීහු බොහෝ ගණනක් ඒකාන්තව ඇතුළත් වී පවතිත්.

එබැවින් කාල, ගති, උපධි, පයෝග අයහපත් අවස්ථාවල දී අකුසල චේතනාවේ ශක්තිය හේතුවෙන් අනිෂ්ට විපාක මතු වන අතර කාලාදිය යහපත් අවස්ථාවල දී කුසල චේතනාවේ ශක්තිය හේතුවෙන් ඉෂ්ට විපාක මතු වේ. බීජයකින් තමාට අදාළ වන්නා වූ එක් ගසක් උපදවා ඉන් අනතුරුව එහි ජනනය කිරීමේ හැකියාව නැති වන්නාක් මෙන්, තමාට අදාළ වන්නා වූ විපාකය දීමෙන් අනතුරුව ඒ ශක්තිය කෙළවර වේ. එබැවින් "චේතනාව නිරුද්ධ වීමේ දී ඒ පරමාර්ථ ධර්මයන් ම නිරුද්ධ වන අතර ඒ චේතනාවේ නානාක්ෂණික කර්ම ශක්තිය විනාශ නොවී දිගින් දිගට ම පවතියි. විපාක ගෙන දෙන කාලය සහ විපාක දීමට අවකාශයක් නොලබමින් අහෝසි කර්ම වන අවස්ථාවට පැමිණි විට චේතනාවන්ගේ ශක්තීන් සියල්ලෙන් සියල්ල නැති වේ ය" යැයි දත යුතු ය.

අනුටීකා - යස්මිඤ්හි සන්තානෙ කුසලාකුසලචෙතනා උප්පජ්ජති, තත්ථ යථාබලං තාදිසං විසෙසාධානං කත්වා නිරුජ්ඣති, යතො තත්ථෙව අවසෙසපච්චයසමවායෙ තස්සා ඵලභූතානි විපාකකටත්තාරූපානි නිබ්බත්තිස්සන්ති.

හි - නිවැරදි ය, යස්මිං සන්තානෙ - යම් සන්තානයක, කුසලාකුසලචෙතනා උප්පජ්ජති - කුසලාකුසල චේතනාවෝ උපදිත් ද, යතො - යම් ශක්ති විශේෂයක් ඉපදීම හේතුවෙන්, තත්ථෙව - ඒ සන්තානයෙහි ම, අවසෙසපච්චයසමවායෙ - සෙසු කාල, ගති, උපධි, ප්‍රයෝග හේතූන් එක් වූ කල්හි, තස්සා ඵලභූතානි - ඒ චේතනාවන්ගේ ඵල වන්නා වූ, විපාකකටත්තාරූපානි - විපාක කර්මජ රූපයෝ, නිබ්බත්තිස්සන්ති - උපදවන්නාහ. තත්ථ - ඒ සන්තානයෙහි, යථාබලං - ශක්තිය ඇති තාක්, තාදිසං - ඒ විපාක කර්මජ රූපයන් උපදවන ස්වභාව ඇත්තා වූ, විසෙසාධානං - ශක්ති විශේෂයක් උපදවීමක්, කත්වා - කොට, නිරුජ්ඣති - නිරුද්ධ වේ.

**ප්‍රත්‍ය ප්‍රත්‍යයෝත්පන්නයන්ගේ පහළ වීම -** ප්‍රත්‍ය ධර්මයන්හි 'අතීත වූ' යන්නෙහි අදහස නම් ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන්ගේ උත්පාද අවස්ථාවේ දී ඒ නානාක්ෂණික කර්ම චේතනාව නිරුද්ධ වී ඇති බව යි. අතීත ලෝභ මූල ප්‍රථම සිතෙහි සම්ප්‍රයුක්ත වන චේතනාව නානාක්ෂණික කර්ම ප්‍රත්‍යය යි. ඒ චේතනාව හේතුවෙන් අපාය භූමියෙහි ප්‍රතිසන්ධි විපාක නාමස්කන්ධයන් ද ප්‍රතිසන්ධි කර්මජ රූපයන් ද, ප්‍රවෘත්ති අවස්ථාවේ දී අකුසල විපාක චක්ඛුවිඤ්ඤාණාදී නාමස්කන්ධයන් ද ප්‍රවෘත්ති කාලයේ දී උපදින්නා වූ අනිෂ්ට කර්මජ රූපයන් ද නානාක්ෂණික කර්ම ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්නයෝ

වෙති. මෙම ක්‍රමයෙන් අකුසල නානාක්ෂණික කර්ම ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන ආකාරය ද දත යුතු වේ.

අතීත මහාකුසල ප්‍රථම සිතෙහි ඇති චේතනාව නානාක්ෂණික කර්ම ප්‍රත්‍යය වේ. ඒ චේතනාව හේතුවෙන් කාම සුගතියේ ප්‍රතිසන්ධි විපාක නාමස්කන්ධ ද ප්‍රතිසන්ධි කර්මජ රූප ද ප්‍රවෘත්ති අවස්ථාවේ දී කුසල විපාක චක්ඛුවිඤ්ඤාණාදී විපාක නාමස්කන්ධ ද ප්‍රවෘත්ති අවස්ථාවේ දී පහළ වන ඉෂ්ට කර්මජ රූප ද ප්‍රත්‍යයෝත්පන්න වේ. රූප භවයෙහි ප්‍රතිසන්ධි නාමස්කන්ධ ද කර්මජ රූප සහ ප්‍රවෘත්ති නාමස්කන්ධ කර්මජ රූප ද ප්‍රත්‍යයෝත්පන්න වේ. සඤ්ඤාවිරාග භාවනා වන්නා වූ අතීත රූපාවචර පඤ්චමධ්‍යානයෙහි ඇති චේතනාව ප්‍රත්‍යය වේ. අසඤ්ඤ සත්ත්ව ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි කර්මජ රූප ප්‍රත්‍යයෝත්පන්න වේ. මාර්ග ජවනයේ ඇති චේතනාව ප්‍රත්‍යය වේ. ඵල ජවන නාමස්කන්ධය ප්‍රත්‍යයෝත්පන්න වේ. (මෙම මාර්ග චේතනාව ඵල ජවනයන්ට ප්‍රත්‍යය වන අවස්ථාවේ දී අනන්තර ශක්තිය සහ පකතූපනිස්සය ශක්තිය ද ලැබේ) ප්‍රත්‍යනීකයෝ සුගම ය.